# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1723/30 - 2011 සැප්තැම්බර් 15 වැනි බ්‍රහස්පතින්දා - 2011.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

මගේ අංකය: බගම/ප්‍රාලේ/2/2/51,

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ?ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරලුකඩ ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක ගා 3903 සහ 2011.08.29 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0202 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

1. කැබලි අංක 1
ඉඩමේ නම: මැණික්ගොඩබැද්ද; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ජී. වික්‍රමතිලක, මහහේන්ගොඩ, බද්දේගම; ප්‍රමාණය: හෙක් 0.0202.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2011 නොවැම්බර් මස 16 වැනි දින අ.භා 2.00 ට බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2011 නොවැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

පී.එස්. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
බද්දේගම.

2011 සැප්තැම්බර් මස 12 වැනි දින,
බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-1397

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.